සමස්ත ලෝකයම කොවිඩ්-19 වසංගතය මර්දනය සඳහා සටන් වදිමින් සිටිනා සමයක, කොවිඩ්-19 සම්බන්ධයෙන් සහ වෛරසය පැතිරීම වැළැක්වීමට අනුගමනය කළ යුතු වෛද්‍ය හා ආරක්ෂක නිර්දේශයන් සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ වගකීම මාධ්‍ය වෙතද පැවරේ. එලෙසින්ම කොවිඩ්-19 ආසාදිතයින් පිළිබඳව සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවීමට ඉඩ නොදීමේ වගකීමේ කොටසක්ද මාධ්‍ය වෙත පැවරේ.

කෙසේ නමුත් එම මාධ්‍ය වගකීමෙන් කෙතරම් ප්‍රමාණයක් සැබවින්ම ශ්‍රී ලංකාවේ මාධ්‍ය ඉටු කරන්නේද යන්න තවමත් පැනයකි.

උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, කොවිඩ්-19 පිළිබඳ වාර්තාකරණයේදී ඇතැම් මාධ්‍ය තවමත් වඩාත් ශිෂ්ට සම්පන්න භාෂා භාවිතයක් වෙත යොමු වී නොමැති වීම දැක්විය හැක. ලංකාදීප පුවත්පතේ (10/23) "කුලියාපිටියේ කොරෝනා කත මියයයි" යනුවෙන් දැක්වෙන සිරස්තලයත්, මව්බිම සිරස්තලයක (10/20) "කොරෝනා කත" යනුවෙන් දැක්වීමත් ඊට නිදසුන් වේ.

සිරස්තලයක් යෙදීමේදී අවම වචන ප්‍රමාණයකින් අදහසක් හෝ පණිවුඩයක් දැක්වීමේ අවශ්‍යතාවය කෙසේ වුවත්, මෙවැනි ශිෂ්ට සම්පන්න නොවන භාෂා භාවිතයකට එය නිදහසට කරුණක් වන්නේද? මෙවැනි අයෝග්‍ය යෙදුම් ජනගත කිරීම ඔස්සේ, කොවිඩ්-19 ආසාදිතයින් සහ නිරෝධායනයට ලක් කොට සිටින්නන් කෙරෙහි සමාජ කොන් කිරීමක් නිර්මාණය නොවන්නේද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Coronavirus #Mawbima #Lankadeepa**